# සමාජ මාධ්‍ය පුද්ගල සම්බන්ධතාව කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සිදුකරන විමර්ශනාත්මක අධ්‍යනයක්

*ඩී.එස්. අභිමානී සමරජීව*[1]

මානවයා තම අදහස් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය සන්නිවේදනය ලෙස සරල ව ඉදිරිපත් කළ හැකි ය. තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයේ සන්නිවේදනය ඉතාමක් සරල ක්‍රියාවක් බවට පත් ව ඇත. වර්තමාන ඇති ව ඇති දියුණුවත් සමඟ පුද්ගල සබඳතාවන් බිඳ වැටීමේ ප්‍රවණතාවක් ගොඩ නැගී ඇත. වත්මන් පුද්ගල මනෝභාවයන්ට අනුව, මිනිසා ඒකාකාරි ජීවන රටාවකට හුරු වී ඇත. මෙහි දී ඇති වන රික්තකයට විසඳුම් සෙවීමේ දී සමස්ත සමාජය තුළ සමාජ මාධ්‍ය භාවිතය ප්‍රමුඛ වී ඇත. අතීතයේ දී රූපවාහිනිය, ගුවන් විදුලිය වටා පවුල් ක්ෂේත්‍රය විසරණය වී තිබුණත් අද වන විට සමාජ මාධ්‍ය ඒ සියල්ල අභිබවමන් පුද්ගලන්ට සෘජු ව බලපෑම් ඇති කරනු ඇත. එහි දී විශාල වසයෙන් සන්නිවේදන ක්‍රියාවලිය පුද්ගල කේන්ද්‍රියත්වයෙන් යුතු ව නිර්මාණය වී තිබේ. ඒ නිසා ම සමාජ පුද්ගල අවශ්‍යතාවන් ද විෂමාකාර වෙමින් විවිධාකාර වූ දිශාවන්ට ව්‍යාප්ත වෙමින් පවතී. එසේ ම වර්තමාන සමාජයේ පුද්ගලයන් සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම පෙළඹීම හේතු කොට ගනිමින් එකිනෙකා අතර සහ සම්බන්ධතාව අවම වීම බහුල ව දැක ගත හැකි වේ. සමාජ මාධ්‍ය පුද්ගල සබඳතාව කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී භාවිත කරන ලද අධ්‍යයන ක්‍රමවේදය වූයේ, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ද්විතීක මූලාශ්‍රය යොදා ගන්නා ලදි. තව ද සම්මුඛ සාකච්ඡා මගින් ද මෙම පර්යේෂණයට අවශ්‍ය වන තොරතුරු රැස් කර ගන්නා ලදි. එසේ රැස් කර ගන්නා ලද දත්ත තුළින් විශ්ලේෂණයේ දී නිගමනය කර ගත හැකි වූයේ වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමඟ සමාජ මාධ්‍ය ජාලා මගින් පුද්ගල සම්බන්ධතාවන්ට වයස් භේදයකින් තොර ව සෘජු හෝ වක්‍ර බලපෑම් රාශියක් එල්ල කරමින් සයිබර් මානසිකත්වයක් ගොඩනගමින් සිටින බවයි. මෙම සමාජ මාධ්‍ය හේතුවෙන් වත්මන් සමාජයේ පවුල් සංස්ථාවන් තුළ ආරවුල් ඇති වීම, විවාහ දෙදරා යාම හා අනියම් සම්බන්ධතා ගොඩනැගීම, විවිධ අපචාර සිදුවීම් ආදිය බහුල ව දැකගත හැකි වේ. වර්තමාන සමාජ සංස්කෘතියේ පුද්ගලයන් අතර සම්බන්ධතාවන් ගොඩනැගීමට නොහැකි වී ඇත්තේ සමාජ මාධ්‍යයන්ගේ ඇති අසීමිත අහිතකර බලපෑම් හේතුවෙන් යන්න මෙම අධ්‍යනය තුළින් නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** සමාජ මාධ්‍ය, පුද්ගල සම්බන්ධතාව, සන්නිවේදනය, තාක්ෂණය, බලපෑම

---

[1] මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය abimanisathsara00@gmail.com